# නව දෑසක් නව ගමක් මැවේ

## මහවැලියේ අත්දැකීම් කිහිපයක්

සශ්‍රීකත්වයෙන් පිරි සිංහල රජ දරුවන්ගේ යුගයේ අභාවයත් සමග පරිහාණියට පත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නැවත නගා සිටුවීමේ යෝධ කාර්ය භාරය මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුළින් ඉටු කරන ආකාරය දෙස මුලු ලොවම බලා සිටින්නේ ඉමහත් බලාපොරොත්තුවෙනි. අතීතයේදී ශ්‍රී ලංකාවේ පමණක් නොව දේශ දේශයන්හි පවා කුසගින්න නිවීමට සහල් නිපදවූ වියළි කලාපයේ ඒ මහා සරු කෙත විදේශීය ආක්‍රමණ නිසා පරිහාණියට ගොස් ශතවර්ෂ කිහිපයක්ම සිංහලයන්ගේ ''වේදනාව''



ජයන්ත ජයවර්ධන මහතා

බවට පත්වූ ආකාරය ඉතිහාසය සාක්ෂි දරයි. එද මෙද තුර නියඟයෙන් වියළී ගොස් ප්‍රාණය හැකිලී ගිය ඒ මහා සරුබිමේ ඛේදාන්තය නිමා කරමින් නව ලොවක් බිහි කරණ මහවැලි ව්‍යාපාරයේ 'එච්' ප්‍රදේශයේ ජනාවාස කරා පසුගියද 'ගොවිජනතාව' පිවිසියේ එහි ගොවීන්ගේ ප්‍රගතියේ නව තතු සොයා බැලීමටයි.

තොරතුරු දැන ගැනීමේ අභිලාෂයෙන් ගල්නෑව ව්‍යාපාර අධිකාරි කාර්යාලයට ගිය අප ප්‍රථමයෙන්ම පිළිගනු ලැබුවේ ව්‍යාපාර අධිකාරි ජයන්ත ජයවර්ධන මහතා විසිනි. මහවැලි ජනාවාස ගැන ඔහුට දැන් කුමන හැඟීමක් ඇතිවන්නේදැයි අප ඇසූ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඔහු මෙසේ කීවේය. ''ඇත්තෙන්ම ජනපදිකයන්ගෙන් පිටස්තරව ජනාවාස ගැන අපට කතා කරන්න බැහැ. අද ජනාවාස දියුණුවක් ලබලා තිබෙනවා කියන්නේ ජනපදිකයන්ගේ තත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වෙලා කියන එකයි.''

ප්‍රශ්නය:

මහවැලි ජනපද සීඝ්‍ර වර්ධනයක් කරා ළඟා උනායයි කියන්නේ කොහොම ද?

පිළිතුර:

**'එච්' කලාපයේ පදිංචි කරවීමට බලාපොරොත්තු වන ගොවි පවුල් 24,000 න් 22715 ක් දැනටමත් පදිංචි කර අවසානයි. මේ අවුරුද්ද අවසන් වීමට පෙර ඉතිරි පවුල් සංඛ්‍යාවද පදිංචි කර අවසන් කරන්න පුළුවන්.**

ප්‍රශ්නය:

ජනාවාස නිෂ්පාදන කටයුතු වලින් ලබා තිබෙන ප්‍රගතිය ගැන හැඳින්වීමක් කරන්න පුළුවන් ද?

පිළිතුර:

ඒක වැදගත් ප්‍රශ්නයක් 1981-1982 මහ කන්නයේදී 'එච්' ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම වගේ නියඟයකට අසුවෙලා තිබුනා. ඒත් සාමාන්‍ය වී නිෂ්පාදනය බුසලකට බුසල් 93 ක් පමණ වුනා. ඒ කාලය තුළ මුලු දිවයිනේ සාමාන්‍ය වී නිෂ්පාදනය බුසලකට බුසල් 60 යි. මේ වතාවේ අපිට අක්කරයකින් අවම වශයෙන් වී බුසල් 100 ක් වත් බලාපොරොත්තු වෙන්න පුලුවන්.

හදිසි රැස්වීමක් නිසා සාකච්ඡාව අතරමඟ නතර කිරීමට සිදුවූයෙන් ඔහු වැඩි තොරතුරු ලබාදීම සඳහා අපට ප්‍රජා සංවර්ධන කටයුතු භාර නියෝජ්‍ය ව්‍යාපාර අධිකාරි ජයවික්‍රම මහතා ළඟට කැඳවාගෙන ගියේය. ජනාවාස ඉතිහාසය හා සංවර්ධනය ගැන අද්විතීය දැනීමක් ඇති ජයවික්‍රම මහතා එම තොරතුරු අප ඉදිරියේ අනාවරණය කළේ රසබර කථා පුවත්ද ඒ හා මිශ්‍ර කරමිනි.

ප්‍රශ්නය:

ජනවාස පිළිබඳ ඉතිහාසයෙන් බිඳක් අපට කියාදෙන්න පුළුවන්ද?

පිළිතුර:

බෝවතැන්න ජලාශයේ වැඩ කටයුතු අවසාන වනවාත් සමගම 1976 අවුරුද්දේ අවසානයේදී අපි

ජනාවාස පිහිටුවීම ආරම්භ කළා. 1976 අප්‍රේල් 4 දා කලාවැවට මුලින්ම ජලය ලබා දීම ඉතා වැදගත් සිද්ධියක්. ඉන්පසු ඉඩම් කැටි කිරීම ආරම්භ කළා. 'එච්' ප්‍රදේශයේ පවුල් 252 ක් පිහිටුවීමෙන් ජනවාස පිහිටුවීම ආරම්භ කළා. බෝවතැන්නේ ජලාශයට යටවුන ගම්වල වැසියන් තමයි අපි මේ ආකාරයට මුලින්ම පදිංචි කළේ.

ප්‍රශ්නය:

ජනාවාස වල පදිංචි කරවීම සඳහා ගොවින් තෝරාගත් ආකාරය ගැන යමක් කීවොත්......?

පිළිතුර:

දැනට ජනාවාස තුළ පදිංචි වෙලා ඉන්නේ කොටස් තුනක පදිංචි කරුවන්. ව්‍යාපාරයට යටවීමෙන් ඉඩම් අහිමිවූ ගොවීන්, බෝවතැන්න, කොත්මලේ, වික්ටෝරියා ආදී ජලාශ වලට යටවූ ප්‍රදේශ වල ගම්වැසියන් සහ මධ්‍යම පළාතේ සෑම ඡන්ද කොට්ඨාශයකින්ම 100 බැගින් තෝරාගත් ගොවීන් වශයෙන් ඒ කොටස් තුන හඳුන්වන්න පුළුවන්.

ප්‍රශ්නය:

ජනපදිකයන් තෝරාගැනීමේදී සැලකිල්ලට ගත් වැදගත් කරුණු ගැන යමක් කියන්න පුළුවන් ද?

පිළිතුර:

ජලාශවලට යටවූ ප්‍රදේශවලින් සහ මධ්‍යම පළාතේ කොට්ඨාශ වලින් ජනපදිකයන් තේරීම එතරම් බරපතල ප්‍රශ්නයක් වුනේ නෑ. ප්‍රශ්නය ඇතිවුණේ ව්‍යාපාරයට යටවූ ප්‍රදේශයේ ගොවීන් නැවත පදිංචි කරවීමේදීය. මේ ප්‍රදේශයේ වැඩි ප්‍රමාණයක් හිටියේ අක්කර 2 ට අඩු ඉඩම් අයිතියක් ඇති අය කුඹුරු අක්කර 2 1/2 ක් සහ ගොඩ ඉඩම් අක්කර 1/2 ක් දීමෙන් ඔවුන්ට පාඩුවක් නොවුනත් අක්කර 5 ට වැඩි ඉඩම් අයිතියක් තිබූ ගොවිපවුල් ඒ ගැන සතුටක් දැක්වූයේ නැහැ. සමහරුන්ට ඉඩම් අක්කර 20 ට වඩා අයිතිව තිබුණා. එවැනි පවුල් වල වයස අවුරුදු 18 ට වැඩි සාමාජිකයන් 3 දෙනෙකුට ඉඩම් කට්ටිය බැගින් ලබා දීමට අපි කටයුතු කළා.

ප්‍රශ්නය:

ජනාවාස පිහිටුවීමේදී ඒවා කොළනි ක්‍රමයෙන් වෙනස් විය යුතු යයි අදහස් කළේ ඇයි කියලා අපට කියන්න පුළුවන් ද?

පිළිතුර:


කොලනි ක්‍රමයේ අඩුපාඩු කමරාශියක් තිබුනා. එය ජනපදිකයන්ගේ ජීවිතයට එතරම් හිතකර නැති බව අත්දැකීම් වලින් හොඳට පැහැදිලියි.

ප්‍රශ්නය:

ඒ පිළිබඳව අපට උදාහරණයක් දෙකක් දෙන්න පුළුවන් ද?

පිළිතුර:

කොලනි ක්‍රමය යටතේ ජනපදිකයන්ට ගමක් ගැන හැඟීමක් තිබුනේ නැහැ. ගමක් අඳුනා ගැනීමට ඒ පිළිබඳ ආදරයක් ඇති වෙන්න එයට නමක් තියෙන්න ඕන. එහෙත් කොලනි හැඳින්වූයේ අංකයකින්. අංකයකින් නැත්නම් ඉලක්කමකින්, ඒ පිළිබඳ හැඟීමක් ඇතිවෙන්නේ නැහැ. අනිත් අතට ඒවායේ ගොවීන් අතර සමඟියක් දකින්න තිබුනේ නැහැ. හේතුව කොලනියක පදිංචි කරුවන් විවිධාකාර ප්‍රදේශ වලින් පැමිණි නන්නාඳුනන පිරිසක් නිසා. මේ තත්වය යටතේ කාෂිකාර්මික සංවර්ධනයක් ගැන කොහොමටවත් බලාපොරොත්තු තියන්න බැහැ. අනිත් අතට මෙවැනි අහිතකර



ජයවික්‍රම මහතා

තත්වයන් යටතේ අපරාධ පවා වැඩි වෙන්නට පටන් ගත්තා. මහවැලි ජනාවාස යටතේ ගම් හැඳින්වීම බොහෝවිට ජනපදිකයන්ගේ කැමැත්තට අනුවයි සිදුවුනේ. උදාහරණ වශයෙන් කියනව නම් 'මහවැලිතැන්න', 'ජයලන්ද' වැනි ගම් මාන ගැන සඳහන් කරන්න පුළුවන්. 'හැලබඩගම', 'හෙලගොවිගම' කියලා හැඳින්වූයෙත් ඒ ආකාරයටමයි.

ප්‍රශ්නය:

ජනපදිකයන්ගේ ජීවන තත්වය නව ක්‍රමය යටතේ දියුණුවුනා යයි කියන්නේ කොහොම ද?

# නව අස්වැන්නක්

පිළිතුර:

මේ වන විට ඉතිරි කිරීම් තුළින් ඔවුන් ලබා ඇති දියුණුව ඊට හොඳ උදහරණයක්. 1981 දෙසැම්බර් වන විට ගල්නෑව ලංකා බැංකුවේ ඉතිරි කිරීම් රු: 5569353/- දක්වා ඉහළ නැඟ තිබෙනවා.

ප්‍රශ්නය:

1976 සිට මේ දක්වා ගොවිජන පදවල සෞඛ්‍ය තත්වය සීඝ්‍ර දියුණු වක් ලබා ඇති බව අපිට පුවත් පත් තුළින් දැනගන්න ලැබුනා. ඒ කියමන හරියි කියලා ඔබ හිතන වා ද?

පිළිතුර:

ඇත්තෙන්ම ඒක සම්පූර්ණ සත්‍යයක්. 1976ට පෙර මේ ප්‍රදේශ වල ගොවීන්ගෙන් 80% ක් පමණ මැලේරියා රෝගයෙන් පීඩාවින්ද. ඒත් දැන් මැලේරියාවෙන් පෙලෙන ප්‍රමාණය 2% කටත් වඩා අඩු තරම්.

ප්‍රශ්නය:

මෙ තරම් සාර්ථක ලෙස මෙ වැනි වසංගතයක් මැඩපවත්වන්න විශේෂ උපායමාර්ගයක් හෙම යොද ගත්තා ද?

පිළිතුර:

ඔව ස්වේච්ඡා සෞඛ්‍ය සේවක ක්‍රමය හඳුන්වා දුන්නේ මැලේරියා මැඩලන්න පුළුවන් පහසුම උප ක්‍රමයක් ලෙස හිතාගෙන. එයට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ ජන සහයෝගයක්ද ලැබුනා.

ඉන්පසු ජයවික්‍රම මහතාගේ උප දෙස් පරිදි අපි ජනාවාස කරා ගියේ ජනපදිකයන් සංවර්ධනයේ පල නෙලා ගන්නා අයුරු දැක ඔවුන් හා කතාබස් කිරීමේ අටියෙනි. උප යලහල්මිල්ලෑව නම් ගමට ගිය අපට මුලින්ම මුණ ගැසුනේ තෝමස් පෙරේරා ගොවි මහතාය.

ප්‍රශ්නය:

තෝමස් පෙරේරා මහතාගේ මෙවර මහ අස්වැන්න කොපමණ ද?

පිළිතුර:

බොහොම හොඳයි. අක්කර 2 1/4 කින් මේ වතාවේ මට වී බුසල් 290 ක් තිබුනා. ඉතිරි අක්කර 3/4 මම එළවලු වගා කළා.

ප්‍රශ්නය:

අපි හිතනවා ඔබට එයින් ලොකු ආදායමක් ලැබෙන්න ඇති කියලා. ඒ මුදල් වලින් අලුත් ගෙයක් දෙරක් හදගන්නා බලාපොරොත් තුවක් නැද්ද?

පිළිතුර:

ට්‍රැක්ටරයක් මිලදී ගන්න එක ඊට වඩා වැදගත්. අපිට තියෙන අක්කර 3න් ගන්න පුළුවන් වැඩිම ප්‍රයෝජනය ගන්න ඕනෑ. අනිත් අතට ලෝකය ඉක්මනින් වෙනස් වෙනවා. අපි පරණ විදියටම ගොවිතැන් කළොත් හැමදාමත් පිරි හෙනවා. ට්‍රැක්ටරයක් තියෙනවා නම් දෙයියන්ගේ පිහිටෙන් හොඳ ගොවිතැනක් කලට වේලාවට කර ගන්න පුළුවන්.

ප්‍රශ්නය:

ජනපදිකයන් වශයෙන් ඔබ මෙහිදී මුහුණ දුන් විශේෂ සිද්ධි යක් හෙම තියෙනවා ද?

පිළිතුර:

මේ වතාවේ විශේෂ ව්‍යාපාර වැඩ සටහනින් මට දෙවන ස්ථානය ලැබිලා තියෙනවා. ඒක මට ලොකු සන්තෝෂයක්.

ප්‍රශ්නය:

යල්කන්නයේදී අතිරේක බෝග වගා කිරීමෙන් වී වගාවට වඩා ආදායමක් ලැබෙනවා ද?

පිළිතුර:

ඇත්තෙන්ම ඔව්. අපි හිතනවාට වඩා ආදයමක් ඒකෙන් ලබාගන්න හැකි. අක්කර 1/8 ක මාලුමිරිස් වගා කරන්න යන වියදම රු: 800/-කි. එයින් රුපියල් 3000-/ක ආදයමක් ලැබෙනවා. ගෝවා පැල අක්කර 1/4 ක වගා කරන්න රු: 1000-/ ක් වියදම් වෙනවා. එයින් රු: 4000/- ක විතර ශුද්ධ ආදයමක් ලැබෙනවා. මේ වතාවේ එය ටත් වඩා අතිරේක බෝග වගා කරන්න බලාපොරොත්තු වෙන් නේ ඒ නිසයි.

# අප මෙලෙසිනි දිවිගෙවන්නේ

ඉන්පසු අපට තොරනේගමදී හමුවූ අවු: 33 ක් වයසැති ගොවියෙක් වූ ඩබ්. ඒ. ගුණතිලක මහතා.........

ප්‍රශ්නය:

ඔබට කුඹුරු අක්කරයකින් මහ කන්නයේදී විශාල අස්වැන්නක් ලැබුන බව ඇත්ත ද?

පිළිතුර:

ඔව්. මම තාත්තාගේ කොටසත් සමග කුඹුරු අක්කර 5 ක් වගා කළා. අක්කරයකට බුසල් 140ක පමණ අස්වැන්නක් ලැබී තිබෙනවා.

ප්‍රශ්නය:

මෙතරම් හොඳ අස්වැන්නක් ලැබීමට හේතුවක් මොකක් කිය ලාද ඔබ හිතන්නේ?.........

පිළිතුර:

අපිට වෙලාවට වතුර ලැබෙනවා. ඒ වගේම පොහොර බීත්තර වී හා උපදෙස් නියමිත වෙලාවට ලැබෙනවා. ගොවි පුහුණු පාඨමාලා වලට යා හැකි වීමෙන් ලැබුන දැනුම නිසා විද්‍යාත්මක ලෙස වගා කටයුතු කිරීමටත් අවස්ථාවක් ලැබුනා.

ප්‍රශ්නය:

ඔබ මෙවර වගා කිරීමට බලාපොරොත්තු වන අතිරේක බෝග මොනවා ද?

පිළිතුර:

බී ලූනු වගා කිරීමෙන් වැඩි ආදායමක් ලබා ගැනීමට පුලුවන් වෙයි කියලා මම හිතනවා. අඩි 100 × 30 භූමි ප්‍රමාණයක බී ලූනු වගාවෙන් රු: 6700/- ක ආදායමක් ලබන්න පුලුවන්. වියදම් වන්නේ රු: 600/- ක පමණ ඉතා සුළු මුදලක්.

ජනාවාස සහ ජනපදිකයන්ගේ තත්වය හැමවිටම ඉහතින් දැක්වූ ආකාරයට සතුටුදායක නොවන බව මෙම චාරිකාවේදී අපට සමහර ගොවීන් තුළින් දැන ගන්නට ලැබුනු සත්‍යයකි. එම ප්‍රදේශයේම ගොවීන් නැවත පදිංචි කළ ගෝන ගල්කන්ද ගමට ගිය අපට මුලින්ම මුණ ගැසුනේ **අවුකන එච්. විජේසේන** නම් තරුණ ගොවි මහතෙකි. ජනපදිකයන් වශයෙන් තමාට මුහුණ පෑමට සිදුවී ඇති කරදර ගැන ඔහු සඳහන් කලේ ඉමහත් වේදනාවකිනි.

ප්‍රශ්නය:

ඔබ මහවැලි ජනපදිකයෙක් වශයෙන් සන්තෝෂයෙන් කතා කරන්න අකමැති ඇයි?

පිළිතුර:

මට එහෙම කතා කරන්න කොහොමටවත් ඉඩක් නැහැ. 1975 අවුරුද්දේ අපි මෙහි නැවත පදිංචි කළාට පසු කිප වතාවක්ම මගේ ඉඩම කුට්ටිය මැනලා මායිම් වෙනස් කළා. දැන් මට ඉතිරි වී ඇති කොටස අක්කර 1 1/2 වත් අඩුයි. ඒ කොටසත් ගල්කුළු වලින් පිරිලා වගා කරන්න ඉඩම් නැති තරම්.

ප්‍රශ්නය:


ඔබ මේ ගැන අදාළ නිලධාරීන්ට පැමිණිලි කළාද?

පිළිතුර:

කිප වතාවක්ම පැමිණිලි කළා. ඒත් වැඩක් වුනේ නැහැ. අනිත් අතට සමහර නිලධාරීන් කුඹුරු බද්දූ අරගෙන වගා කරනවා. ඒ අය අපේ කුඹුරු වලට වඩා ජලය සැපයීමේදී තමන්ගේ කුඹුරු ගැනයි සලකා බලන්නේ. අපට කිප වතාවක්ම හරිහැටි වගා කරන්න ජලය නැතිව ගියා.

ප්‍රශ්නය:

ඔබ මෙවර මහ කන්නයේදී ලැබූ අස්වැන්න ප්‍රමාණවත් යයි කියලා හිතනවා ද?



පිළිතුර:

පහසුකම් හරියට නැති නිසා අක්කරයට ලැබුනා වී බුසල් 40 ක් විතර. ඒක ගත් ණය ගෙවා ගන්නවත් මදි. ණය ගෙව්වොත් අපට ඊළඟ කන්නයේ හාමතේ මැරෙන්නයි වෙන්නේ. දැන් අපට ණය ගෙවන්නත් බැහැ. ඒ නිසා නැවත ණය ලබාගන්නත් බැහැ.

ප්‍රශ්නය:

මහවැලි ව්‍යාපාරය යටතේ ලැබී ඇති වෙනත් පහසුකම් ගැන ඔබට සතුටු විය හැකිද?

පිළිතුර:

කොහොමටවත් බැහැ. පාසැල් යන්න ළමයින්ට ගමන් පහසුකම් නැහැ. අපේ ළමයි ගල්ගමුවේ ස්කෝලේට යන්නේ සැතැප්ම ගණනක් පයින්. වෙලාවට බස යක් නැහැ.

**ලිව්වේ - කපිල බණ්ඩාර**
**සේයා - රංජිත් දිසානායක**